# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-09-08 |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ඩබ්.ජ්.පී. වික්‍රමසූරිය මයා ඇතුලු පිරිස,<br>ශ්‍රීනා, බෝධිය මාවත,<br>ගැවිලිපිටිය,<br>අරණායක. |
| වගඋත්තර පාර්ශවය | 01 | ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |
| | 02 | විදුහල්පතිනිය,<br>කෑගලු බාලිකා විදුහල,<br>කෑගල්ල. |

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/K/320/19/A</u>**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම**

2019 වසරේ අතරමැදි පංති (7 ශ්‍රේණිය) සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට අයදුම්පත් කැඳවීම මත තම දියණියන් ඇතුලත්කර ගැනීම සඳහා කෑ/කෑගලු බාලිකා විද්‍යාලයට අයදුම්පත් යොමු කල බවත් අයදුම් කරන ලද සියලුම සිසු දියණියන් වෙනුවෙන් ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන් සඳහා පවත්වන්නට යෙදුන විභාගයේ ප්‍රතිඵල ශිෂ්‍යත්ව ලකුණු හා අනෙකුත් සුදුසුකම් සලකා බලමින් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛන පදනම මත විදුහල්පතිතුමිය ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලබා ගත් ලකුණු පදනම් කර ගනිමින් ඉතා සාධාරණ හා අපක්ෂපාතීව තෝරා ගන්නා ලද නම් ලැයිස්තුව අනුමැතිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත යොමු කර ඇති බවත්.

එහිදී 07 ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා වන එම ලැයිස්තුව අවලංගු කල බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් කටයුතු අංශයෙන් විමසීමේදී දැනගන්නට ලැබුණු බවත්, එවකට පැවති



ප්‍රධාන කාර්යාලය 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. සභාපති 011 2505451 ෆැක්ස් 011 2505541/74 ඊමේල්

චක්‍රලේඛය අනුව අපක්ෂපාති හා ඉතා නිවැරදි භාවයෙන් ලකුණු පදනම මත තෝරා ගන්නට යෙදුනු ඉංග්‍රීසි සහ සිංහල යන මාධ්‍යයන් දෙකටම ඇතුලත් සිසුන් 19 දෙනාගෙන් යුත් ලැයිස්තුවේ පසුවන දියණියන් කෑ/කෑගලු බාලිකා විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්ය.

**වගඋත්තර පාර්ශවයේ සැල කිරීම**

වගඋත්තර පාර්ශවය ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරුණු දක්වා ඇත්තේ ජාතික පාසල්වල විදුහල්පතිවරුන් වෙත යොමු කොට 2008/37 චක්‍රලේඛ ප්‍රකාරව නිර්දේශ ලබා දෙන ලෙස දන්වා යැවීම සාමාන්‍ය ක්‍රමවේදය බවත්. ඒ අනුව පාසල් වල 1, 5, 6 හැර අතරමැදි ශ්‍රේණි සඳහා පවතින පුරප්පාඩු අනුව 2008/37 චක්‍රලේඛ ප්‍රකාරව සකස් කරන ලද විදුහල්පති නිර්දේශිත නාම ලේඛන සඳහා අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන එම අනුමත ලේඛන අනුව ඇතුලත් කිරීමේ කටයුතු කිරීම සඳහා නැවත විදුහල්පතිවරුන්ට යැවීම සාමාන්‍ය ක්‍රමවේදය වුවත් අතරමැදි ශ්‍රේණි සඳහා දිනපතා ලැබෙන අතිවිශාල ඉල්ලීම් සංඛ්‍යාව සලකා බලා සැමට පොදු විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාව කලක සිට පැවති බවත්

ඒ අනුව ක්‍රමවේදය සකස් කිරීමට පත් කරන ලද කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් 2019 වර්ෂයේ ජාතික පාසල් වල අතරමැදි ශ්‍රේණි ශිෂ්‍ය සංඛ්‍යාව හා පුරප්පාඩු පිළිබඳ තොරතුරු 2019-05-30 දිනට පෙර වලංගු වන පරිදි ගෙන්වා ගන්නා ලද බවත්. ඒ අනුව ජාතික පාසල් සියල්ලේ ම පවතින පුරප්පාඩු ගණනය කොට 2019.07.03 දිනැති දිණමින, ලංකාදීප, වීරකේසරී යන පුවත්පත්වල දැන්වීමක් මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද බවත්. එහිදී එක් එක් ජාතික පාසල් වල ශ්‍රේණි අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව, තෝරා ගැනීමේ ක්‍රමවේදය, ලකුණු පටිපාටිය, අයදුම් කළයුතු ආකාරය ඇතුළු සියලු තොරතුරු ඇතුලත්ව දිවයිනේ ඕනෑම අයදුම්කරුවෙකුට අයදුම් කළහැකි වන පරිදි පැහැදිලිව විනිවිද භාවයකින් යුතුව ඉදිරිපත් කර ඇති බවත්. ඒ අනුව 2018 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ පවත්වා විදුහල්පතිවරුන් විසින් නිර්දේශ කර අනුමැතිය සඳහා එවා තිබූ සියලුම ලේඛන අවලංගු කරන ලද බවත් ය.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වන කරුණු**

01 පැමිණිලිකරුවන් තමන්ගේ දරුවන් 2019 වර්ෂයේ කෑගලු විද්‍යාලයේ 7 ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 37/2008 අනුව අයදුම් කර ඇත.

02 ජාතික පාසල් වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කිරීමේ 37/2008 චක්‍රලේඛයට අනුව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර තෝරා ගත් පැමිණිලිකරුවන්ගේ දරුවන් ඇතුළු දරුවන් 64 දෙනෙකුගේ නාම ලේඛනය (සිංහල මාධ්‍ය ) හා දරුවන් 25 දෙනෙකුගේ නාම ලේඛනය (ඉංග්‍රීසි මාධ්‍ය) 2019.03.29 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

03 එහෙත් තෝරා ගත් නාම ලේඛනය සඳහා අධ්‍යාපන ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොදී අංක 33/2019 ලෙස චක්‍රලේඛයක් නිකුත් කර 2019.07.03 දින දිනමිණ, ලංකාදීප, වීරකේෂරී යන පුවත්පත් වල දැන්වීම් පල කර අයදුම්පතක් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා නැවත තෝරාගත් නාම ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

04 ඒ අනුව අංක 37/2008 චක්‍රලේඛනය අනුව සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත්වූ පැමිණිලිකරුවන්ගේ දරුවන් වෙනුවට පසුව නිකුත් කළ අංක 33/2019 චක්‍රලේඛනය අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගත් දරුවන් පමණක් අතරමැදි ශේණි (7 ශේණිය) සඳහා ඇතුලත් කර ගැනීම මගින් පැමිණිලිකරුවන්ගේ දරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවී ඇති බව තහවුරු වේ.

05 අංක **37/2008** චක්‍රලේඛනය අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක යටතේ ආසන්නතාවය සඳහා දුර ප්‍රමාණය අනුව උපරිම ලකුණු 10 ක් ප්‍රධානය කර ඇති අතර පැමිණිලිකරු ලකුණු 06 ක් උපයාගෙන ඇත. එහෙත් අංක **33/2019** චක්‍රලේඛනය අනුව ආසන්නතාවය සඳහා ලකුණු 50 ක් ප්‍රධානය කර අනෙකුත් නිර්ණායක සඳහා ලකුණු 50 ක් වෙන් කිරීම තුළ පැමිණිලිකරුට අගතියක් සිදුවී ඇති බව පෙනී යයි.

06 අංක **37/2008** චක්‍රලේඛනය අනුව පවත්වන ලද පළමු සම්මුඛ පරීක්ෂණයේදී විදේශගතව පැමිණීම යටතේ ප්‍රධානය කරනු ලබන ලකුණු 10 න් 06 ක් උපයා ගැනීමට අවස්ථාව ලැබී ඇති නමුත් අංක **33/2019** චක්‍රලේඛනය අනුව දෙවන සම්මුඛ පරීක්ෂණයේදී විදේශගතව පැමිණීම යටතේ කිසිදු ලකුණක් ලබා නොදීම තුළ පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුවී ඇති බව පෙනී යයි.

07 අංක **37/2008** චක්‍රලේඛනය අනුව පවත්වන ලද පළමු සම්මුඛ පරීක්ෂණයේදී අධ්‍යාපනික සුදුසුකම් යටතේ ශිෂ්‍යත්ව විභාගයේ ලබාගත් ලකුණු ප්‍රමාණය සමස්ථ ලකුණු වලට එකතු කර ඇති නමුත් අංක **33/2019** චක්‍රලේඛනය යටතේ අදාළ නිර්නායක ඉවත් කිරීම තුළ අදාළ ලකුණු ප්‍රමාණය නොලැබීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවාට අගතියක් සිදුවී ඇති බව පෙනී යයි.

08 අංක **37/2008** චක්‍රලේඛනය අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී එම අවස්ථාවේදී ඉගෙනුම ලබන පාසල සඳහා ලකුණු ලබාදීමේදී නිර්ණායක යටතේ ලකුණු 04 ක් ලබාගෙන ඇති නමුත් අංක **33/2019** චක්‍රලේඛනය යටතේ අදාළ නිර්ණායක ඉවත් කිරීම තුළ අදාළ ලකුණු ප්‍රමාණය නොලැබීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවාට අගතියක් සිදුවී ඇති බව පෙනී යයි.

09 අංක **37/2008** චක්‍රලේඛනය අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී අධ්‍යාපන සුදුසුකම් යටතේ අවසාන වාර විභාගයේ ලකුණු සඳහා ලකුණු ලබාදීමේ නිර්නායක යටතේ අවසාන වාර විභාගයේ සාමාන්‍ය ලකුණු ප්‍රමාණය 78.91 සමස්ථ ලකුණු වලට එකතු කර ඇති නමුත් **33/2019** චක්‍රලේඛනය අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී අධ්‍යාපන ප්‍රගතිය සඳහා ලකුණු ලබාදීමේ නිර්ණායක යටතේ අවසාන වාර විභාග ලකුණු වල සාමාන්‍ය සඳහා ලකුණු ලබාදීමේදී 50 % වැඩි සාමාන්‍ය සඳහා ලකුණු 10 ක් පමණක් ලබාදීම තුළින් පැමිණිලිකරුගේ දරුවාට අගතියක් සිදුවී ඇති බව තහවුරු වේ.

**නිගමනය**

අංක **37/2008** චක්‍රලේඛනය අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම සඳහා භාවිතා කළ නිර්ණායක අංක **33/2019** චක්‍රලේඛණය යටතේ පවත්වන ලද දෙවන සම්මුඛ පරීක්ෂණයේදී භාවිතා නොකිරීම හා වෙනස් කිරීම මගින් පැමිණිලිකරුගේ දරුවාට අදාළ විද්‍යාලයට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වීම මගින් පැමිණිලිකරුගේ දරුවාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 12(1) වගන්තියෙන් සහතික කොට ඇති සමාන ලෙස සැලකිලි ලැබීමට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බව නිගමනය කරමි.

**නිර්දේශය**

පැමිණිලිකරුගේ දරුවා **2022** වර්ෂයේදී 10 ශ්‍රේණිය සඳහා කෑගල්ල විද්‍යාලයට ඇතුළු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.10.10 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),

සභාපතිනි,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත් 01 ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල

02 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල

රේ/-